# (ඇ) මහ බැංකු කටයුතු

මහ බැංකුවේ වත්කම්/වගකීම් 1966 අවසානය හා 1967 අවසානය අතරේදී රුපියල් දශලක්ෂ 631·6 කින් හෙවත්, සියයට 33·4 කින් ඉහළ ගියේය. වත්කම්වල මෙම ඉහළයාම දේශීය වත්කම් රුපියල් දශලක්ෂ 514·2 කින් වැඩිවීම හා ජාත්‍යන්තර සංචිත රුපියල් දශලක්ෂ 117·4 කින් ඉහළ යෑම මගින් සිදු විය. ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා බැංකු ආයතන වෙතැති තැන්පතු දශලක්ෂ 159·0 කින් ඉහළ යාම හා විදේශීය බැංකු වලින් ගත් ණය රුපියල් දශලක්ෂ 57·1 කින් ඉහළ යෑම මහ බැංකුවේ විදේශීය වගකීම් ප්‍රසාරණය වීමට හේතු විය. 1967 වර්ෂය තුලදී පැවැති මහ බැංකුවේම රුපියල් දක්ෂ ලක්ෂ 28·4 ක සුරැකුම්පත් වර්ෂය මුලදී මුළුමණින්ම විසුම් ගන්වන ලදී. මහ බැංකුවේ ව්‍යවහාර මුදල් නිකුතුව රුපියල්දශලක්ෂ 79·1 කින් ඉහළ ගිය අතර, වෙළඳ බැංකු වෙතැති තැන්පතු වගකීම් රුපියල් දශලක්ෂ 157·1 කින් වැඩි විය.

මහ බැංකුවේ දේශීය වත්කම් ප්‍රසාරණය වීමට මූලික වශයෙන් හේතු වූයේ, රජයට හා වෙළඳ බැංකුවලට ණය අත්තිකාරම් දීමේ ප්‍රතිඵලයක් වශයෙනි. මහ බැංකුවේ, රජයේ හා රජය ඇප වූ සුරැකුම්පත් දැරීම්, රුපියල් දශලක්ෂ 109·9 කින් වැඩි විය. මේ හැරෙන්නට රජයට දුන් අත්තිකාරම් ද රුපියල් දශලක්ෂ 12·7 කින් වැඩි විය. තව දුරටත් රජය මහ බැංකුව වෙතැති තැන්පතු රුපියල් දශ ලක්ෂ 39·1 කින් අඩු කර ගන්නා ලදී. වර්ෂය තුලදී වෙළඳ බැංකුවලට දුන් ණය අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 59·3 කින් වැඩි විය.

**ණය ප්‍රතිපත්තිය.**

1966 දී වූ ණය පාලන විධිවිධාන 1967 ද ක්‍රියාත්මක වූයේය. මහ බැංකුව, වෙළඳ බැංකු පෞද්ගලික අංශයට දෙන ණය හැසිරෙන ආකාරය ගැන තියුණු පිරික්සුම කින් සිටි අතර, එසේ කරන ලද්දේ අයෝග්‍ය ප්‍රසාරණාත්මක ප්‍රවණතාවයන් මැඩලීම සඳහා විධිවිධාන ගැනීම් වස්ය. බැංකු සේවකයන්ගේ වැඩ වර්ජනයක් පැවතීම නිසා අස්වාභාවික තත්ත්වයක් පැවැති පෙබරවාරි හා මාර්තු මාස වලදී හැර, සැප්තැම්බර් දක්වා මාසවලදී ණය ප්‍රසාරණයක් නියම වශයෙන් පිළිපිඹු නොවීය. මෙම මාස දෙකේ දී පැවැති ණය ප්‍රසාරණය ඊළඟ පස්මස තුළදී විරුද්ධ අතට හැරිණි. වර්ෂය අවසාන මාස හතර තුළදී ණය ප්‍රසාරණයක් පැවතියත්, මෙය වුවමනාවට වැඩි යැයි කල්පනා නොකරන ලදී. විශේෂයෙන්ම වෙළඳ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ ඉතිරි කිරීමේ හා කාලීන තැන්පතු සීඝ්‍රයෙන් ඉහළ ගිය ආකාරය අනුව බලන කළ මෙසේ පෙනුනි.

මෙසේ මූල්‍ය ප්‍රතිපත්තිය ආර්ථික ක්‍රමය කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරන ණය සීමා කිරීම කෙරෙහි අවධාරණය තබන්නක් වූ අතර, වර්ෂය තුළදී ණය සීමා කිරීමේ අළුත් විධිවිධාන ගැනීම අවශ්‍යයැයි කල්පනා නොකරන ලදී. ඒ අතරතුරේදීම, නිෂ්පාදන අරමුණු සඳහා ණය ලෙහෙසියෙන් ලබාගත හැකි වීමේ අවශ්‍යතාවය ගැන ද මහ බැංකුව කල්පනාකාරී විය. වෙළඳ බැංකු මගින් කෘෂිකාර්මික ණය දීමේ නව ක්‍රමය හා එයට සම්බන්ධ, මහ බැංකුව මගින් ප්‍රතිණය පහසුකම් සැපයීමේ ක්‍රමය මේ දෙසට ගන්නා ලද පියවරකි. බැංකු හා අනෙකුත් ණය දෙන ආයතන විසින් දෙන මැදි හා දිගු කාලීන ණය සඳහා මහ බැංකුවේ ප්‍රති ණය කිරීමේ ක්‍රමය දනටමත් පවතින අතර, 1967 වර්ෂය තුළදී මෙයින් විපුල ප්‍රයෝජන ලබා ගන්නා ලදී.

**ග්‍රාමීය ණය - නව කෘෂිකාර්මික ණය ක්‍රමය.**

නව කෘෂිකාර්මික ණය ක්‍රමය 1967/68, මහ කන්නයේ ආරම්භ වන 1968 සැප්තැම්බරයේ සිට ක්‍රියාත්මක විය. ගොවියාගේ දෘෂ්ටි කෝණයෙන් බලතොත් මෙම නව කෘෂිකාර්මික ණය ක්‍රමය ප්‍රධාන කරුණු 2 ක් උඩ, ඔහුට වඩාත් වාසි සහගතය. ප්‍රථමයෙන් ණය ලබා ගැනීමේ ක්‍රමය දියුණු කිරීම නිසා වගා වාරය ආරම්භ වීමට කලින් ණය ලබාගැනීමට ඔහුට පුළුවන්කම ලැබී ඇත. දෙවනුව ණය සීමාව උස් කිරීම නිසා, අවශ්‍ය විට වැඩියෙන් ණය ලබා ගැනීමට හැකියාව ලැබී තිබේ.

පැරණි ණය ක්‍රමය යටතේ ණය ඉල්විය යුත්තේ ඇත්ත වශයෙන්ම ගොවියා වගා කිරීමට බලාපොරොත්තු වන භූමිය සම්බන්ධ කොට ගෙනය. මෙයින් අදහස් කරන්නේ ණය ඉල්ලුම් කිරීමට කලින් ගොවියා වැසි පැමිණෙන තෙක් බලා සිටිය යුතු බවයි. මෙහි ප්‍රතිඵලය වූයේ ඉඩම සකස් කිරීමට කල්තියා නොහැකි වීම පමණක් නොව, අවශ්‍ය පොහොර මිළදී ගැනීමට ද ණය ලබාගත නොහැකි වීමයි. මේ නිසා ගොවියාට ආයතනික නොවන මාර්ග වලින් කෙටි කාලීන ණය ලබා ගැනීමට සිදුවිය. නව ක්‍රමය යටතේ ණය ඉල්ලුම් පත් ඉදිරිපත් කරන්නේ වගා කන්නයට ඉතාමත් කලින්ය. එසේ කිරීමේදී එක් එක් ගොවියා ඔහුට අයත් සියලුම අස්වැද්දිය හැකි ඉඩම් වගා කරනු ලැබේයයි උපකල්පනය කරනු ලැබේ. අනතුරුව මෙම ණය සහ ඉල්ලුම් පත්‍ර, පවත්නා වර්ෂා තත්වය යටතේ සංශෝධනය කොට ලබා දෙන මුදල් ගණන අවශ්‍ය තන්හිදී අඩු කරනු ලැබේ. වගා කන්නයට සෑහෙන තරම් කලින් ණය ඉල්ලුම් කර ඇති නිසා එම ඉල්ලුම් පත්‍ර පරීක්ෂා කිරීම සඳහා වෙළඳ බැංකු වලට ප්‍රමාණවත් කාලයක් ලැබෙන්නේය. එසේම ණය දීම පමාවීම ද මෙයින් වලකී.

එක් එක් ගොවියා සතුව පැවති උපරිම ණය සීමාව වන අක්කරයකට රුපියල් 175 ගණනේ පැවති අක්කර 6, අක්කරයකට රුපියල් 200 ගණනේ අක්කර 10 දක්වා වැඩි කරන ලදී. පහත දැක්වෙන්නේ, අරමුණු අනුව පැරණි හා නව ක්‍රමය යටතේ අක්කරයකට දෙන ණයෙහි සීමාවන් අනුව කළ බෙදුමකි.

**අක්කරයට ණය දීමේ සීමාව අරමුණු අනුව බෙදා දැක්වීම**

| | පැරණි ක්‍රමය රුපියල් | නව ක්‍රමය (1967 මහ කන්නයේ සිට) රුපියල් |
|---|---|---|
| බිත්තර වී | 24·00 | 32·00 |
| සීසෑම | 40·00 | 55·00 |
| පොහොර | 36·00 | 58·00 |
| පැළ සිටුවීම හෝ පේලි වැපිරීම | 25·00 | 25·00 |
| නෙලීම හා වල් පැලෑටි නාශක | 25·00 | 25·00 |
| අස්වනු කටයුතු | 25·00 | 25·00 |
| එකතුව | 175,00 | 220,00 |

එකිනෙක ණය නිකුත් කරනුයේ කොටස් තුනකිනි. මුල් කොටස බිත්තර වී හා සීසෑම සඳහාය. දෙවෙනි කොටස මුල් කොටස ලැබී මසකට පමණ පසු පොහොර පැල සිටුවීම් හෝ වැපිරීම සහ වල් පැල නෙලීම සඳහා ලැබේ. අවසාන කොටස අස්වනු කපා ගැනීම සඳහාය.

නව ක්‍රමය යටතේ ණය ලබා ගැනීමේදී ගොවියා තමාගේ හා තම පවුලේ සලාක පොත් සමුපකාර සමිතියට භාර දීමට එකඟ විය යුතුය. මෙසේ කළ යුත්තේ ණය ආපසු ගෙවීමට අසමත් තත්ත්වයකදීය. එසේ භාරදුන් සලාක පොත් කූපන්වල අගය, නොගෙවූ ණය වෙනුවෙන් යෙදිය යුතුය. මෙසේ නොකළ යුත්තේ අස්වනු පාලුවක් ඇති වූවිට පමණි.

මෙම ක්‍රමය යටතේ වෙළඳ බැංකු ප්‍රාථමික සමුපකාර සමිති මගින්, ගොවියන්ට ණය දුන් ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවේ ස්ථානය හිමි කර ගෙන ඇත. වගා ණය දීමේදී වෙළඳ බැංකුවල සාමාන්‍ය ණය දීම් හා සම්බන්ධ අවදානමකට වඩා වැඩි අවදානමක් දරණ හෙයින්, රජය මෙම ක්‍රමය යටතේ ගොවියාට දුන් ණය සම්බන්ධයෙන් සියයට 75 ක් ආපසු ගෙවීමට ඇපවී තිබේ. රජය වෙනු වෙන් මෙම ඇපවීමේ ක්‍රමය ක්‍රියාත්මක කරනුයේ මහ බැංකුව විසිනි. මහ බැංකුව නව කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ වෙළඳ බැංකු විසින් දෙන මුළු ණය ප්‍රමාණය වෙනුවෙන් ප්‍රති මුදල් කිරීමේ පහසුකම් ලබා දීමෙන් මෙම අරමුණු සඳහා ක්ෂණිකව ණය ලබා ගැනීමේ හැකියාව සහතික කරයි.

මෙසේ සංශෝධනය කළ ණය සීමාවන් යටතේ 1967 දෙසැම්බර් අවසානය තෙක් [1]මහජන බැංකුව අනුමත කළ මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 81·4 කි. කෙසේ වෙතත්, 1967 දෙසම්බර් 31 වැනිදා වන විට සමුපකාර සමිති විසින් ලබාගෙන තිබුනේ මෙම මුළු ණය ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 44·4 කි. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් පාලනය වූ පැරණි ක්‍රමය යටතේ, ඕනෑම වර්ෂයක් සඳහා ලබා දුන් මුළු උපරිම ණය ප්‍රමාණය වූයේ, 1963/64 මුදල් වර්ෂයේ දී වූ රුපියල් දශ ලක්ෂ 34·6 ය. 1967/68 මහ කන්නය වෙනුවෙන් අනුමත කළ මුදල වන රුපියල් දශ ලක්ෂ 81·4 මුළුමනින් ගනියැයි සිතිය නොහැකිය. නොයෙකුත් අරමුණු සඳහා නියම කළ ණය සීමා අනුව, එකිනෙක ණයෙන් සියයට 90 ක්ම දෙන ලද්දේ වගා කිරීම, බිත්තර වී, පොහොර යෙදීම, අතින් හෝ රසායනික ක්‍රමයෙන් නෙලීම, සඳහාය. මේ අරමුණ සඳහා අරමුදල් ගොවියාට දිය යුතුව තිබුණේ මුල් කොටස් දෙක සමගය. අස්වනු කපා ගැනීමට දෙන ණය, එකිනෙක ණය මුදලේ තුන්වන කොටසින් පියවේ. මේ අනුව 1967 දෙසැම්බර් අවසානය වන විට අනුමත විශාල ප්‍රමාණයක් ලබා ගෙන තිබිය යුතුයයි පෙනියයි. මෙයට හේතුව, ඒ වන විට සෑම ප්‍රදේශයකම පොහොර යෙදීම ඇතුළු මූලික සකස් කිරීමේ කටයුතු අවසන් වන හෙයිනි. කෙසේ වෙතත් මෙම දිනය වන විට ලබා ගෙන තිබුණු මුළු ණය ප්‍රමාණය අනුමත කළ මුළු ණය පිරිමාවෙන් සියයට 54·5 කි. මෙසේ අනුමත කළ ණයෙන් ලබා ගත් ණය ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් අඩුවීම සුදුසු පරීක්ෂණ වලින් තොරව පැහැදිලි කිරීම අපහසුය. කෙසේ වෙතත් නව ක්‍රමය යටතේ වී වගාව සඳහා ලබා ගැනීමට පුළුවන් ණය ප්‍රමාණය විශාල ලෙස පුළුල් කර ඇති බව පැහැදිළිය. 1967 දෙසැම්බර් අවසානය දක්වා මාස තුනේදී මහ කන්නය වෙනුවෙන් ලබාගත් මුළු මුදල ණය ප්‍රමාණය වන රුපියල් දශ ලක්ෂ 44·4, කලින් පැවති ඉහළම ණය ප්‍රමාණය, එනම් 1963/64 වර්ෂයේ කන්න දෙකම සඳහා දුන් ප්‍රමාණය වන රුපියල් දශ ලක්ෂ 34·6 ට වඩා වැඩිය. 1968 පෙබරවාරියේදී ඇරඹෙන මහකන්නයේ අස්වනු කාලයත් සමගම නව ක්‍රමය යටතේ දුන් ණය ආපසු ගෙවීම සිදුවේ යයි බලාපොරොත්තු වේ.

**මැදි හා දිගු කාලීන ණය අරමුදල.**

1967 වර්ෂයේ, ඉකුත් වර්ෂයට වඩා, මහ බැංකුවේ මැදි හා දිගු කාලීන ණය ක්‍රමය යටතේ, ප්‍රති මූල්‍ය පහසුකම් වලින් වැඩිපුර ප්‍රයෝජන ගනු ලැබීය. මෙම ක්‍රමය යටතේ, 1967 දී ලබා දුන් මුළු ප්‍රති මූල්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4·2 ක් වූ අතර, 1966 දී දුන් රුපියල් දශ ලක්ෂ 2·6 හා සැසඳේ. ආපසු ගෙවීම් අඩු කළ පසු, 1967 අවසානයේදී පැවැති ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4·9 කි. මෙයින් වෙළඳ බැංකු ලබා ගත්තේ දශ ලක්ෂ 0·2 ක් පමණි; මෙයද තේ කර්මාන්තශාලා දියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයට වෙළඳ බැංකු විසින් ලබා දුන් ණය සම්බන්ධයෙනි. අනෙක් ණය දෙන ආයතන, ඒවායෙන් පෞද්ගලික අංශයට කාර්මික අරමුණු සඳහා ලබාදුන් ණය වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 4·7 ක ප්‍රතිමූල්‍ය ණය ලබාගෙන ඇත.

---

1 වෙන කිසිම බැංකුවක් මෙම ක්‍රමය යටතේ ණයදී නැත.

බැංකු වර්ධනය.

ආර්ථික සංවර්ධනය සඳහා ඉතිරි කිරීම එලදායි අන්දමින් මෙහෙය වීමට නව ආයතන ක්‍රමයක් පිහිටුවීම සම්බන්ධයෙන් රජය කලින් කළ යෝජනාවක් අනුව, මේ වර්ෂයේදී මහ බැංකුව පනතක් මගින්, ජාතික ඉතිරි කිරීමේ බැංකුවක් පිහිටුවීම සම්බන්ධවිස්තර යෝජනා පරීක්ෂා කරන ලදී.

රටේ ආර්ථික සංවර්ධනයෙහි ලා වඩාත් ගතික සේවාවක් ඉටු කිරීමට හැකි වන පරිදි, රජයේ දිගු කාලීන ණය දෙන සංස්ථා වන, රජයේ උකස් බැංකුව, කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන සංස්ථාව, ප්‍රතිසංවිධානය කිරීමේ අවශ්‍යතාවය කලක සිටම මහ බැංකුවට අවබෝධ වී තිබිණි. ලංකා උකස් බැංකුව මූලික වශයෙන් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා මුදල් සැපයීමට අවධානය යොමු කළ යුතුයයි ද වැටහිණ. මෙම පරමාර්ථය සිත්හි තබාගෙන, මහ බැංකුව යෝජනා ගණනක් පරීක්ෂා කළ අතර, බැංකු ක්‍රියාවලියේ ක්ෂෙත්‍රය සහ එහි බලතලවල පුළුල් කිරීමක් ඇති කිරීම සඳහා, විශේෂයෙන් ඉඩම් ඔප්පු පිළිගැනීම් සහ බැංකුවේ ප්‍රතිණය ක්‍රමය යටතේ ණය ගැනීමට ඇති හැකියාව පිළිබඳව, රජයට නිර්දේශ කරනු ලැබිය. තවද සංස්ථාව ප්‍රතිසංස්කරණය කොට සංවර්ධන කටයුත්තේ දූනට වඩා සපල අන්දමින් සහභාගි කරවා ගැනීමේ අරමුණ ඇතිව මහ බැංකුව කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන සංස්ථාව සමග සාකච්ඡා ගණනාවක් පවත්වන ලදී.

මහජන බැංකු කොමිෂන් වාර්තාවේ වූ නිර්දේශයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන්, මහ බැංකු පනතේ නොයෙකුත් අංශයන් පිළිබඳව මහ බැංකුව විමර්ශනයක යෙදුණි. කොමිෂමේ නිර්දේශයන් පිළිබඳව මහජන බැංකුවේ අදහස් ද, මහ බැංකුව විසින් සලකා බලන ලදි. මූලික වෙනස් කිරීමක් පෙන්නුම් කරන නිසා රජයට පනත් පැනවීම සම්බන්ධයෙන් නිශ්චිත යෝජනා ඉදිරිපත් කිරීමට කලින් සූක්ෂම අන්දමින් පරීක්ෂා කිරීම වඩා උචිත බවද කල්පනා කරන ලදී.

වර්ෂය තුළදී ලංකාවේ සියළුම බැංකු වෙනුවෙන් තැන්පතු රක්ෂණ කිරීමේ ක්‍රමයක් ද, මහ බැංකුව විසින් පිළියෙල කරන ලදී. මෑත අවුරුදුවලදී බැංකු කටයුතු වල ප්‍රසාරණයක් සිදුවීම නිසා, මෙවැනි ක්‍රමයක් අවශ්‍ය යැයි කල්පනා කරන ලදී. මහ බැංකුවේ යෝජනාවන් රජයට ඉදිරිපත් කර ඇති අතර, මේ අනුමත වූ විගස මහ බැංකුව විසින් රක්ෂණ කිරීමේ ක්‍රමය ගොඩ නැංවීමේ කටයුතු ආරම්භ කරනු ඇත.